# සාමාන්‍ය සමයේ දසසතරවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 46: 1-7, 28-30

"ඔබේ මුහුණ දුටු හෙයින් දැන් මම සැනසීමෙන් මිය යන්නෙමි."

ජාකොබ් හෙවත් ඉශ්රායෙල් තමන් සතු සියල්ල රැගෙන ගමනට පිටත්ව බෙයර්-ෂෙබාවට පැමිණ තම පියාවූ ඊසාක්ගේ දෙවියන් වහන්සේට යාග පූජා ඔප්පු කළේය. දෙවියන් වහන්සේ ද රාත්‍රියේ දී ජාකොබ් දර්ශනය වී, "ජාකොබ්, ජාකොබ්" කියා ඔහු ඇමතූ සේක. ඔහු "මම මෙහි ය" කියා උත්තර දුනි. එවිට උන් වහන්සේ කතා කරමින් "මම නුඹේ පියාගේ දෙවියන් වහන්සේ වෙමි. මිසරයට යැමට බිය නොවන්න. මන්ද, මම එහි දී නුඹේ පෙළපතින් මහත් ජාතියක් ඇති කරන්නෙමි. මම නුඹ සමඟ මිසරයට ගොස් යළි මම ම නුඹ ආපසු ගෙනෙන්නෙමි. තවද නුඹ මැරෙන විට ජෝසෙප්ගේ අත නුඹේ ඇස් පියවන්නේ ය"යි වදාළ සේක.

පසුව ජාකොබ් බෙයර්-ෂෙබාවෙන් පිටත් විය. ජාකොබ්ගේ පුත්‍රයෝ තම පියා ද, තමන්ගේ කුඩා දරුවන් ද, තම භාර්යාවන් ද පාරාවෝ ඔවුන් ගෙන යැමට එවූ රථවල රැගෙන ගියහ. තවද තමන්ගේ ගව පට්ටි ද කානාන් දේශයේ දී තමන් උපයා ගත් වස්තුව ද රැගෙන ජාකොබ් සහ ඔහු කැටුව ඔහුගේ මුළු පෙළපත මිසරයට පැමිණියහ. මෙලෙස ඔහු තම පුත්‍රයන් ද පුත්‍රයන්ගේ පුත්‍රයන් ද පුත්‍රයන්ගේ දූවරුන් ද මුළු දරු පෙළපත ද තමන් කැටුව මිසරයට ගෙන ආවේය.

තවද, ජාකොබ් ජෝසෙප් ඉදිරියට පැමිණෙන පිණිස, තමාට පෙරටුව ඔහු වෙතට ජුදා එව්ය. ඔව්හු ගෝෂෙන් නම් පෙදෙසට පැමිණියහ. එවිට ජෝසෙප් තම රථය සූදානම් කොට, තම පියා වන ජාකොබ් හමුවීමට ගෝෂෙන් බලා ගියේය. තම පියා දුටු කෙණෙහිම ඔහු ඔහුගේ ගෙල බදාගෙන බොහෝ වේලාවක් ගෙල මත හැඬීය. එවිට ජාකොබ් ජෝසෙප්ට කතා කොට, ඔබේ මුණ දැක ඔබ තවම ජීවත්ව සිටින බව දුටු හෙයින් දැන් ඉතින් මා මළත් කම් නැතැ"යි කීවේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **37:3-4, 18-19, 27-28, 39-40**

පිළිතුර: හිමිතුමාණෝ දැහැමියන් ගලවන සේක.

ගීය:

සමිඳුන් කෙරේ විශ්වාසය තබා යහපත කරන්න. දේශයෙහි සුව සේ වෙසෙන්න. සමිඳුන් කෙරේ ප්‍රීතිමත් වන්න. එතුමන් ඔබේ මනදොළ ඉටු කරනු ඇත.

හිමිතුමාණෝ සැදැහැවතුන් දිනෙන් දින රැකගනිති. ඔවුන්ගේ උරුමය සදහට ම පවතියි. විපත් සමයේ දී ඔවුන්ට විපතක් නැත. සාගත සමයේ දී ඔවුන්ට හිඟයක් නැත.

චිර කල් යෙහෙන් වැජඹෙනු ඇත. හිමිතුමාණෝ යුක්තියට ප්‍රිය මනාප ය. සිය සැදැහැවතුන් අත් නොහරිති. ඔව්හු සදහට ම රැකවරණය ලබති. එහෙත් දුදනන්ගේ පරපුර වැනසෙති.

හිමිතුමාණෝ දැහැමියන් ගලවන සේක. විපතේ දී ඔවුන්ට බලකොටුවක් වන සේක. හිමිතුමාණෝ ඔවුන්ට පිහිට වී ඔවුන් මුදන සේක. සිය සරණ සොයා එන ඔවුන් එතුමාණෝ දුදනන්ගෙන් මුදාලන සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ වචනය සදහටම පවතියි.
මේ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්න වන්නේය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල උන්වහන්සේ සම්පූර්ණ සත්‍යය කරා යාමට ඔබට මග පෙන්වන සේකැ" යි ස්වාමින් වහන්සේ වදාල සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 10: 16-23

"ඔබ නොව ඔබේ පියාණන්ගේ ආත්මයාණෝ ඔබ තුළින් කතා කරන සේක."

ජේසුස් සමිඳාණන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට මෙසේ වදාළ සේක.
"සවන් දෙන්න, වෘකයන් මැදට බැටළුවන් යවන්නාක් මෙන් මම ඔබ යවමි. එහෙයින් සර්පයන් මෙන් නැණවත්ව පරෙවියන් මෙන් අහිංසකව සිටින්න. ඒ නිසා මිනිසුන්ගෙන් පරිස්සම් වන්න. මන්ද, ඔවුන් ඔබ උසාවි වලට පාවා දී, ඔවුන්ගේ ධර්මශාලාවලදී ඔබට තළනු ඇත. ඔවුන්ට හා විජාතීන්ට සාක්ෂියක් පිණිස ඔබ මා නිසා ආණ්ඩුකාරයන් ද රජුන් ද ඉදිරියට ගෙන යනු ලබනු ඇත. එහෙත් ඔවුන් ඔබ පාවා දෙන කළ, ඔබ කතා කළයුත්තේ කෙසේද, කිව යුත්තේ කුමක් දැයි සිතමින් කරදර නොවන්න. මන්ද, ඔබ කිවයුතු දේ නියම වේලාවේ දී ම ඔබට දෙනු ලැබේ. කතා කරන්නේ ඔබ නොව, ඔබ තුළින් කතා කරන ඔබේ පියාණන්ගේ ආත්මයාණෝ ය.

"තවද, සහෝදරයා තම සහෝදරයා ද පියා තම දරුවා ද මරණයට පාවා දෙන්නෝය. දරුවෝ ද මව්පියන්ට විරුද්ධව නැගී සිට ඔවුන් මරණයට පත් කරවන්නෝ ය. මාගේ නාමය නිසා සියල්ලන් ඔබට වෛර කරනු ඇත. එහෙත්, අන්තිම දක්වා ස්ථිරව සිටින්නා ගැළවෙන්නේ ය. ඔවුන් එක් නුවරකදී ඔබට පීඩා කළහොත් ඊළඟ නුවරට දිව යන්න. සැබැවින්ම මම ඔබට කියමි. මනුෂ්‍ය පුත්‍රයාණන් එන්නට පෙර, ඉශ්රායෙල්හි සියලු නුවර වල සැරිසරා නිම කරන්නට ඔබට නොහැකි ය.

සුවිශේෂ වාක්‍යය එසේය